# "පියුමක ලස්සන"

ගී සඳලුව



සිසිර දිසානායක

සිංහල ගේය පද නිබන්ධන ක්ෂේත්‍රයට යතිවරුන්ගෙන් ලැබුණ දායකත්වය විශේෂයි. බෞද්ධ භික්ෂූන් වහන්සේලා මෙන්ම, කතෝලික පියතුමන්ලා ද අපගේ ගීත රචනා නඟා සිටුවී-මෙහිලා මුල් තැනක් ගන්නවා.

වසර 1984 දී පමණ ගීත රචනා ක්ෂේත්‍රයට එළැඹ මේ වනතුරුත් එම කාර්යයෙහි නියැලී සිටින ස්වාමීන් වහන්සේ නමක් මේ දිනවල ඩැංඩිනොං ධම්මදීප භාවනා මධ්‍යස්ථානයේ වැඩ වාසය කරනවා. උන්වහන්සේ තමයි පූජ්‍ය මහගම සීලානන්ද ස්වාමීන් වහන්සේ. අපගේ ගී රචනා ක්ෂේත්‍රයේ දැවැන්තයෙකු වූ මහගම සේකරයන් උපන් පින් බිමේම ඉපිද, පැවිදිව දැනට වේයන්ගොඩ අරියනන්දනාරාම පුරාණ විහාරස්ථානයේ නායක පදවිය හොබවන උන්

> අද ළමයින්ගේ රස වින්දනය බොහොම පහළ මට්ටමකට වැටිලා තියෙනවා බොහෝ හේතූන් නිසා. වර්තමාන අධ්‍යාපන ක්‍රමය, ජන මාධ්‍ය මේකට බලපාලා තියෙනවා. ඒ නිසා ළමා නිර්මාණ කරන අයවත් මේ ගැන යමක් කරන්න ඕන. අද කාලෙ ළමයි කියන්නෙ වැඩිහිටියන්ටවත් සුදුසු නැති විදියේ අවර ගණයේ ගීත. ඒවා අහනකොට ඇඟ කිළිපොලා යනවා.

වහන්සේ සිංහල ළමා ගී එකතුවක් එළිදැක්වූ මුල් ම ගීත රචකයායි. "ගී සඳලුව" වෙනුවෙන් අප උන්වහන්සේ ඩැන්ඩිනොං විහාරයේදී බැහැ දුටුවා.


කලාව, සංගීතය පිළිබඳව බුදුරජාණන් වහන්සේගේ දැක්මත්, බුදු චරිතයේ අවස්ථා කිහිපයකුත් බුද්ධ ධර්මයේ දැක්වෙන කරුණුත් අප හට සිහිපත් කරමින් පූජ්‍ය මහගම සීලානන්ද ස්වාමීන් වහන්සේ පිළිසඳරට මුල පිරූ සේක.

"පංචසික කියන වීණා වාදකයා සූරිය මජ්ජිසා කියන තමන්ගේ පෙම්වතිය ගැන වර්ණනා කරමින් කරපු ගායනාවත් වාදනයත් අහලා බුදුරජාණන් වහන්සේ පැහැදුණාය කියලා අපි අහලා තියෙනවානේ. ඒ ඇසුරෙන් තමයි බුදුරජාණන්වහන්සේ සක්කපඤ්ඤ සූත්‍රය දේශනා කර වදාළේ. ඒ වගේ ම ථේර ගාථා, ථේරී ගාථා නිර්මාණය වෙලා තියෙන්නේ පරිසරයේ ඇති නිරාමිස ප්‍රීතිය විඳිමින්. බෞද්ධ පරිසරය නිසා ම චිත්‍ර කලාවක් බොදු ගී කලාවක්, මූර්ති කලාවක් බිහි වුණා. ඉතින් ඔය ආකාරයෙන් ගත්තොත් ස්වාමීන් වහන්සේලා කලා කටයුතුවලට සම්බන්ධ වීම මුල් කාලවල ඉඳන්ම කෙරුණ දෙයකි. සන්දේශ කාව්‍යවල ඉඳන් මේ වෙනකල් උන්වහන්සේලාගෙන් ලබන සාහිත්‍ය පෝෂණය වටිනවා"

"ඉතින් මමත් කවි ලියන්න පෙළඹුනේ පිරිවෙන් අධ්‍යාපනය හදාරණ කාලයේදී. මුලින්ම පත්තරවලට එහෙම කවි ලිව්වා. ඉන් පස්සේ තමයි ගීත නිර්මාණයට ප්‍රවිෂ්ඨ වුණේ. මුලින් ම මගේ ගීතය ප්‍රචාරය වෙන්නේ ගුවන් විදුලි සංස්ථාවේ "මියැසිය" ජන සංගීත වැඩසටහනේ. බන්දුල විජේවීර ගායන ශිල්පියා තමයි සංගීතවත් කරලා ගායනා කළේ. ඒ 1984 වර්ෂයේදියි.

"ගීත නිර්මාණය කරනකොට මම භික්ෂූන් වහන්සේ නමක් විදියට බුදු ගුණ, මව් ගුණ වගේ තේමා තමයි තෝරා ගත්තේ. ඊට අමතරව සමාජ විෂමතාවය ගැනත් ගීත කිහිපයක් කරලා තියෙනවා. ගීත විශාල ගණනක් කරලා නම් නෑ. මොකද විවේක බුද්ධියෙන් හෙමින් ආව ගමන්ක මේ. ඒ ගමනේ වැදගත් පියවරක් විදියට "පියුමක ලස්සන" කියලා ළමා සංගත තැටියක් එළි දැක්වීම මතක් කරන්න පුළුවන්. ළමයින් වෙනුවෙන් යමක් කරන්න ඕන කියලා හිතලයි ඒ කළේ. ඒ 2008 වර්ෂයේදී." මේ ළමා ගී එකතුව වෙනුවෙන් විශාරද නන්දා මාලනී, ආචාර්ය වික්ටර් රත්නායක, විශාරද එඩ්වඩ් ජයකොඩි වාගේ ප්‍රවීණයින් ගායනයෙන් දායක වුණා. තනු නිර්මාණ නිපුන් සනත් නන්දසිරි, රෝහණ වීරසිංහ, නවරත්න ගමගේ, සුසිල් අමරසිංහ, ජගත් වික්‍රමසිංහ, වික්ටර් රත්නායක, විශාරද රෝහණ ධර්මකීර්ති, විශාරද නන්දා මාලනී වගේ ප්‍රවීණයින් අතින් කෙරුණා. නවරත්න ගමගේ මහත්තයා තමයි සංගීත අධ්‍යක්ෂණය කළේ. මේ දේවල් සම්බන්ධීකරණ කළේ, පූජ්‍ය රඹුක්කන සිද්ධාර්ථ ස්වාමීන් වහ්නසේ" ස්වාමීන් වහන්සේ ඒ අය හට ස්තුතිවන්ත වුණා.

"මුලින් ම සරළ ගීයක් විදියට එළියට ආවේ ටී. එම්. ජයරත්න මහත්තයා ගායනා කරපු "බාල ළමා සිත" කියන ගීතයයි. මගේ ගීත ගායනා කරපු අය අතරට, අතුල අධිකාරී, සමිතා මුදුන්කොටුව, පාලි දිසානායක, රෝහණ සිරිවර්ධන, සරත් ඕවිටිගල, සනත් නන්දසිරි, මල්කාන්ති නන්දසිරි, විජේසුන්දර වේරගොඩ, දයාන් විතාරණ, අතුල සෝමසිරි, නාලනී සෝමසිරි, ත්‍යාගා එන්. එඩ්වඩ්, ආර්. ඩී. පුණ්‍යසෝම කියන ගායක ගායිකාවනුත් එකතු වෙනවා.



භික්ෂූන් වහන්සේලාගෙන් අපගේ සාහිත්‍යයට ලැබුණු දායකත්වය පිළිබඳව පූජ්‍ය මහගම සීලනන්ද ස්වාමීන් වහන්සේගේ මතකය නැවත අවදි කළේ මේ ආකාරයෙන්.

"ඉතිහාසයේ ඉඳන්ම ඒ දායකත්වය ඉහළින්ම ලැබුණා ඇත්තටම. ඉන් පෝෂණය වුණා අපේ සාහිත්‍යය. නමුත් ගීතය කියන අංගය බිහිවෙන්නේ පසුකාලීනව. සීගිරි ගී තමයි අපට මුලින්ම මතක් වෙන්නේ. ඒ අතරත් භික්ෂුවක් ලියපු කවි තියෙනවා කියලත් තියෙනවානේ. මොනවා වුණත් ගීත සාහිත්‍යයේ පුරෝගාමී යතිවරයා විදියට මම දකින්නේ පූජ්‍ය වැලමිටියාවේ ධම්ම රක්ඛිත හාමුදුරුවෝ. ඊට පස්සේ යතිවර ගී පද සංකල්පනා සිහසුන මත තබන්නේ පූජ්‍ය රඹුක්කන සිද්ධාර්ථ හාමුදුරුවෝ. ඊට පස්සේ පරපුරයි අපි. මම හිතනවා ගීත සාහිත්‍යයට ප්‍රබල මෙහෙවරක් භික්ෂූන් වහන්සේලාට කරන්න පුළුවන්. ගීතය කියන්නෙත් ප්‍රබල කලා මාධ්‍යයක්. ජනතාව අතරට හොඳ පණිවිඩ ගෙනියන්න පුළුවන්. ධර්ම ප්‍රචාරයෙන් අපි කරන්නෙත් ඒකමයිනේ."

"ස්වාමීන් වහන්සේලාට කලාව කිරීම කැප ද කියලා කතිකාවතක් පහු ගිය දවස්වල තිබුණා. නමුත් අර මුලින්ම කිව්වා වගේ බුද්ධ ධර්මය තුළ සෞන්දර්යය ප්‍රතික්ෂේප වෙන්නේ නෑ. හැබැයි යම් යම් සීමාවල් පැවිදි අයට විතරක් නෙමෙයි, ගිහියන්ටත් තියෙනවා. ජනතාවට යහපතක් වෙන, ජනතාව සුවපත් වෙන නිර්මාණ තමයි බිහි වෙන්න ඕන. පසුගිය කාලයේ යතිවරයින් අතින් ලියවුණ ගීත දිහා බලපුවාම කාට වුණත් පසක් වෙනවා ඒ දේ වුණාය කියන එක."

"ළමා ගිත ගැන කියනකොට මට මුලින්ම මතක් වෙන්නේ ටිබෙට් ජාතික පූජ්‍ය එස්. මහින්ද ස්වාමීන් වහන්සේ. උන් වහන්සේ ළමයින් වෙනුවෙන් කවි නිර්මාණ කළා. ඒවා පසු කාලීනව ගීත බවට පත්වුණා. ඒවා අදටත් ජනප්‍රියයි. ළමයින්ට කරන නිර්මාණ හරි ප්‍රවේශමෙන් කරන්න ඕන දෙයක්. ළමා සිත හඳුනාගෙන, ළමා ක්‍රියාකාරකම්වලට සම්බන්ධ කරගෙනයි ලියන්න ඕන. ආනන්ද සමරකෝන් ශූරීන්, මුණිදාස කුමාරතුංග මහත්මාණන් වාගේ විශිෂ්ඨයෝ එදා ළමයින් වෙනුවෙන් ලිව්වා."

අද ළමයින්ගේ රස වින්දන මට්ටම බොහොම පහළ මට්ටමකට වැටිලා තියෙනවා බොහෝ හේතූන් නිසා. වර්තමාන අධ්‍යාපන ක්‍රමය, ජන මාධ්‍ය මේකට බලපාලා තියෙනවා. ඒ නිසා ළමා නිර්මාණ කරන අයවත් මේ ගැන යමක් කරන්න ඕන. අද කාලෙ ළමයි කියන්නෙ වැඩිහිටියන්ටවත් සුදුසු නැති විදියේ අවර ගණයේ ගීත. ඒවා අහනකොට ඇඟ කිළිපොලා යනවා. ගරු ඉනාමලුවේ සුමංගල හාමුදුරුවන්ගේ උපදේශකත්වයෙන් කරන දඹුල්ලේ "රංගිරි ශ්‍රී ලංකා" එෆ්. එම්. නාලිකාවනම් අනික් නාලිකාවලට වඩා හොඳ යමක් කරනවා. හොඳ දේ ගැනත් කතා කරන්න ඕනනේ. අගය කරන්න ඕන ඒ දේවල්.

ආචාර්යවරයෙකු වශයෙන් ද පූජ්‍ය මහගම සීලානන්ද ස්වාමීන් වහ්නසේ දරුවන් පිළිබඳව උන්නදු වන සේක. පාසැල් කටයුතු වෙනුවෙන්ද උන් වහන්සේ නිබන්ධනයෙහි යෙදෙන සේක. ග්‍රන්ථ කිහිපයක් ද එළි දක්වා ඇති අතර ඒවා ධර්ම පුස්ථක වෙයි. ඉදිරියේදී නවතම ගීත ඇතලත් සංයුක්ත තැටියක් හා ගී රචනා පොතක් එළි දැක්වීමට අදහස් කරනා උන් වහන්සේට සුභ පතමින් හා පාඨකයින් වෙනුවෙන් කෘතවේදීව පුණ්‍යානුමෝදනා කරමින් පිළිසඳර නිමා කළා.

සියනෑ කෝරළයේ සාහිත්‍යයෙන් සාරවූ ගමක ඉපිද ඒ ගම් පියසේ වෙල් ඉපනැල්ලේ දුව පනිමින් හැදී වැඩී පැවිදි දිවියට ඇතුළත් වූ පූජ්‍ය මහගම සීලානන්ද ස්වාමීන්වහන්සේ අදටත් සිහිපත් කරනා එක් දෙයක් වෙයි. ඒ සිය ගිහි දිවියේදී පරිශීලනය කළ, නිවසේ වූ පියාගේ පුසතකාලයයි!

## අවමංගල්‍ය ස්තුතිය

එන්ඩේවහිල්ස් සහ ඕබ්රි හි විසූ එලාරිස් ද සිල්වා මහතාගේ අවමංගල්‍යයට වැඩම කළ ගරු අකරවිට සංඝානන්ද ස්වාමීන්වහන්සේ ඇතුළු ගරුතර සංඝ රත්නයටත් අවමංගල්‍ය කටයුතු වෙනුවෙන් සහභාගිවීමෙන් හා නන් අයුරින් සහය දුන් සැමටත් සීහෙළ සහ 3ZZZ ගුවන් විදුලිසේවා වලටත් සන්නස පුවත්පතටත් අපේ කාරුණික ස්තුතිය මෙයින් පිරිනමමු

**ශෝකයට පත්**



**ආර්යා ද සිල්වා - බිරිඳ**
**ලාල්, ජයන්ත නාමල්, උපුල් පුතුන්**
**ජානකී සහ නෙළුම් දියණියන්**
**හෙන්රි සහ ගාමිණී බෑණනුවන්**
**ලකී, මහෝෂ සහ ෂේන් මුණුබුරන්**